730.9548
GUN

# ලංකාවේ බෞද්ධ ලෝහමූර්ති

(ආරම්භයේ සිට ක්‍රි.ව. 1235 දක්වා )

ප්‍රංගිගේ සීතා පද්මිනී ගුණරත්න, බී.ඒ.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ දර්ශන විශාරද උපාධිය ( Ph.D.) සඳහා පේරාදෙණි මණ්ඩපයට ඉදිරිපත් කරන ලද නිබන්ධය.

1977 මාර්තු

328859

## ග්‍රන්ථසාරය

මෙම නිබන්ධයට විෂය වූ 'ලංකාවේ බෞද්ධ ලෝහමූර්ති' පිළිබඳව සාකච්ඡා කිරීමේදී මුල් පරිච්ඡේදයෙන් අනාවරණය වන්නේ මෙරට ලෝහමූර්ති හා සම්බන්ධ ඓතිහාසික පසුබිමයි. එහිදී අදාල කාලපරිච්ඡේදය යුගවලට බෙදා, එම අවධිවලදී ලෝහවාත්තුව පැවති බව හා ලෝහමූර්ති නිර්මාණය වූ බව සනාථ කෙරෙන සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක සාධක පිළිබඳව සාකච්ඡා කොට ඇත. දෙවැනි පරිච්ඡේදය වෙන්වී ඇත්තේ ශිල්පක්‍රමය සඳහායි. මෙහිදී ලංකාව මෙන්ම අනෙකුත් රටවල්ද ලෝහමූර්ති වාත්තුවේදී උපයෝගී කරගත් විවිධ ශිල්පක්‍රම විග්‍රහකොට, ඒවා එකිනෙක හා සැසඳීමට උත්සාහයක් දරන ලදී. තවද ඒ ඒ රටවල භාවිත වූ විවිධ ලෝහවර්ග, විවිධ සංයුති, අනුපාත හා උපකරණ පිළිබඳවද විමර්ශනය කොට ඇත. තුන්වැනි පරිච්ඡේදයේදී මෙම අවධියට අදාල වූ වැදගත් ලෝහමූර්ති පමණක් තෝරාගෙන ඒ පිළිබඳ සවිස්තරාත්මක සටහන් ඉදිරිපත් කර තිබේ. මෙහිදී එම මූර්ති බුද්ධප්‍රතිමා, බෝධිසත්ත්ව ප්‍රතිමා හා ලෝකපාල ප්‍රතිමා යන ශීර්ෂ යටතේ වර්ගකොට ඒවා සොයාගනු ලැබූ ස්ථානත්, මිණුම් ප්‍රමාණ හා විශේෂ ලක්ෂණත්, දැනට ඒවා තැන්පත්කොට ඇති ස්ථානත් විස්තර කොට ඇත. සිව්වැනි පරිච්ඡේදය යොදාගෙන ඇත්තේ එම මූර්තිවල ප්‍රතිමා ලක්ෂණ විමසීම සඳහායි. බුද්ධප්‍රතිමාවෙහි ප්‍රතිමා ලක්ෂණ විමසීමේදී එහි ස්වරූපයත් ඊට අනුබද්ධ සිරස්පත, ප්‍රභාව ආදී බාහිර අංගත්, මුද්‍රා, ආසන පීඨ වැනි ලක්ෂණත් පුළුල් වශයෙන් විමර්ශනය වී ඇත. බෝධිසත්ත්ව මූර්ති හා ලෝකපාල මූර්තිවල ප්‍රතිමා ලක්ෂණ විග්‍රහකොට ඒ අනුසාරයෙන් එම මූර්ති කවරෙකු නිරූපණය කරන්නේදැයි හඳුනාගැනීමට උත්සාහයක් දරා තිබේ. ඉහතකී මූර්තිවල විවිධ ශෛලීන් විස්තර කිරීමටත්, ඒවායෙහි දැක්වෙන විශේෂ ලක්ෂණ මෙන්ම විදේශීය ආභාසයන් හා ස්වාධීන ලක්ෂණ පිරික්සීමටත් අවසාන පරිච්ඡේදය වෙන් කොට ඇත. ශෛලීන් පදනම්කොටගෙන එම මූර්ති නිර්මාණය වූ කාලය පිළිබඳව අනුමාන වශයෙන් නිගමනයන්ට එළඹීම මෙම නිබන්ධයේ අවසන් කාර්යයයි.